# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகைஅறிக்கை
# Performance Report

# 2012

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව -මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**
**தேசியதிட்டமிடல் திணைக்களம - நிதிதிட்டமிடல் அமைச்சு**
Department of National Planning – Ministry of Finance and Planning

## කාර්ය සාධන වාර්තාව - 2012

## ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව


**1.** දැක්ම, මෙහෙවර, කාර්යයන් සහ වගකීම් 3

**2.** දෙපාර්තමේන්තුවේ ඒකක සහ අංශ 4

**3.** ආංශික කාර්යය සාධනය 5

3.1 කෘෂිකර්ම, වාරිමාර්ග හා ඉඩම් 5

3.2 මහජන උපයෝගිතා 8

3.3 මාර්ග, වරාය, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, ජනමාධ්‍ය තැපැල් හා සන්නිවේදන 10

3.4 කර්මාන්ත, වෙළඳ, වෘත්තීය පුහුණු සහ වැවිලි 12

3.5 සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා, ක්‍රීඩා නිවාස සහ නාගරික සංවර්ධන 14

3.6 අධ්‍යාපන හා සෞඛ්‍ය 16

3.7 පරිසර, තාක්ෂණ හා පර්යේෂණ, ධීවර හා සංචාරක 18

3.8 සාර්ව ආර්ථික, සමාජ ආරක්ෂණ, ශ්‍රමික සහ බන්ධනාගාර 22

3.9 රාජ්‍ය කළමනාකරණය 25

**4.** සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය 26

**5.** මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය 27

**6.** මූල්‍ය කාර්ය සාධනය 36

## 01 දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

**දැක්ම**

ආසියාවේ ආශ්චර්ය කරා ශ්‍රී ලංකාව මෙහෙයවීම

**මෙහෙවර**

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුනතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම.

**ප්‍රධාන කාර්යයන්**

**(i)** මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන සැලසුම්, රාජ්‍ය අයෝජන වැඩ සටහන් සම්පාදනය කිරීම සහ ආංශික සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සැකසීම සඳහා රේඛීය ආයතන වලට සහාය වීම.

**(ii)** සාර්ව ආර්ථික රාමුව සහ උපාය මාර්ග වැඩි දියුණු කිරීම.

**(iii)** ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති, අදාළ උපාය මාර්ග සහ වැඩසටහන් විමසුමට ලක් කිරීම සහ ව්‍යාපෘති ඇගයීම.

**(iv)** වාර්ෂික ප්‍රාග්ධන අයවැය සැකසීම සඳහා තාක්ෂණික සහාය සැපයීම.

**(v)** ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති පිළිබඳ මූලික විස්තර ඉදිරිපත් කිරීම.

**(vi)** ව්‍යාපෘති සැලසුම්කරණය හා ප්‍රතිපත්ති සම්පාදනයට අදාළව දෙපාර්තමේන්තුව වෙත පවරණු ලබන විශේෂ පැවරුම් ක්‍රියාත්මක කිරීම.

## 02. දෙපාර්තමේන්තුවේ ඒකක හා අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 09 කට වෙන් කර ඇත. එම අංශ 09 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 31 කට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

**දෙපාර්තමේන්තුවේ අංශ**

**(i)** කෘෂිකර්ම වාරිමාර්ග හා ඉඩම්

**(ii)** මහජන උපයෝගිතා

**(iii)** මාර්ග, වරාය, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, මාධ්‍ය, තැපැල් සහ සන්නිවේදන

**(iv)** කර්මාන්ත, වෙළඳ, වෘත්තීය, පුහුණු සහ වැවිලි

**(v)** සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා, ක්‍රීඩා, නිවාස සහ නාගරික සංවර්ධන

**(vi)** අධ්‍යාපන හා සෞඛ්‍ය

**(vii)** පරිසර, තාක්ෂණ සහ පර්යේෂණ, ධීවර, සංචාරක හා ආපදා කළමනාකරණ

**(viii)** සාර්ව ආර්ථික, සමාජ ආරක්ෂණ, ශ්‍රමික, බන්ධනාගාර සහ ප්‍රාදේශීය සංවර්ධන

**(ix)** මහජන කළමනාකරණ

මීට අමතරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා පහත අංශ 3 ද ඇත.

**1.** සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය

**2.** පරිපාලන අංශය

**3.** මූල්‍ය අංශය

## 03. ආංශික කාර්ය සාධනය

### 3.1 කෘෂිකර්ම, වාරිමාර්ග හා ඉඩම්

**කෘෂිකර්ම**

කෘෂිකර්මාන්තය, රටෙහි ශ්‍රම බලකායෙන් සියයට 33 (මිලියන 2.6) ක් පමණ වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වන අතර ඔවුන්ගෙන් වැඩි කොටසක් ග්‍රාමීය සහ වතු ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වේ. 2005 වර්ෂයේදී සියයට 17.2 ක් වූ දළ දේශීය නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම අංශයේ දායකත්වය, නිෂ්පාදන සහ සේවාවන් අරමුණු කරගත් අංශ වල සීඝ්‍ර වර්ධනය හේතුවෙන් 2012 වර්ෂයේදී සියයට 11.1 දක්වා අඩු වූවද කෘෂිකර්ම අංශය ශ්‍රී ලංකා ආර්ථිකයේ අඩිතාලම ලෙස තවදුරටත් අඛණ්ඩව පවතී.

2012 වර්ෂයේ කෘෂිකාර්මික අංශය සඳහා රජයේ මුළු වියදම රුපියල් මිලියන 64,348 ක් වූ අතර, මුළු වියදමෙන් රුපියල් මිලියන 48,248 ක් පොහොර සහනාධාරය විය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාවට, වඩා දියුණු සහ තත්ත්වයෙන් උසස් සේවාවන් සැපයීම තුලින් කෘෂිකාර්මික අංශයේ වර්ධනය ඉහළ දැමීම රජයේ අරමුණයි. මේ සඳහා පොහොර සහනාධාරය ඇතුළත්ව කෘෂිකාර්මික සේවා සැපයීම වෙනුවෙන් 2002 වර්ෂයේ වූ රුපියල් මිලියන 3,949 කට සාපේක්ෂව 2012 වර්ෂයේ රුපියල් මිලියන 56,634 ක් ආයෝජනය කර ඇත. දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් කෘෂිකාර්මික ආනයන අවම කිරීමේ අරමුණින් බෝග නිෂ්පාදන වැඩසටහන් සඳහා 2012 වර්ෂයේදී රුපියල් මිලියන 3,574 ක් ආයෝජනය කර ඇති අතර එය 2002 වර්ෂයට සාපේක්ෂව විශාල වැඩිවීමකි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ශ්‍රී ලංකාවේ දැනට පවතින වෙළඳ සහ මිල ප්‍රතිපත්ති, කෘෂිකාර්මික සහනාධාර කෙරෙහි පවතින බලපෑම සම්බන්ධයෙන් ලෝක බැංකුව මගින් සකස් කරන ලද වාර්තාව සමාලෝචනය කිරීම.
- "දැයට කිරුළ - 2012 " ප්‍රදර්ශනය වෙනුවෙන් පත්‍රිකා සකස් කිරීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික යෙදවුම් සහ තොරතුරු සැපයීම.
- "දැයට කිරුළ - 2013 " ප්‍රදර්ශනය පැවැත්වෙන පොලොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර යන දිස්ත්‍රික්කවල සැලසුම් සකස් කිරීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික යෙදවුම් සහ තොරතුරු සැපයීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2011 වාර්ෂික වාර්තාව සඳහා" ඵලදායිතාව උදෙසා කෘෂිකර්මාන්තය " යන කෘෂිකාර්මික උප පරිච්ඡේදය සකස් කිරීම.
- ව්‍යාපෘති යෝජනා 33 ක් ඇගයීම සහ අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ 23 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- වියලි කලාපීය ජීවනෝපායන් සඳහා සහයවීමේ සහ හවුල්වීමේ වැඩසටහනට අදාළ කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වීම.

**පශු සම්පත්**

පශු සම්පත් අංශය ප්‍රධාන වශයෙන් කිරි ගව සහ කුකුළු යන උප අංශ දෙකෙන් සමන්විතය. 2012 වසරේ මෙම අංශය සඳහා සමස්ත ආයෝජනය රු. මිලියන 2,544 ක් වූ අතර, එයින් රු. මිලියන 2,105 ක් මූලධන වියදම් ලෙස දේශීය ප්‍රභේද නංවාලීම, සත්ත්ව රෝග නිවාරණය, ව්‍යාප්ති සේවා පුළුල් කිරීම සහ ග්‍රාමීය ප්‍රජාව සංවර්ධනය සඳහා යොදවා ඇත. පශු සම්පත් අංශය සිදුකරනු ලබන සියලුම ක්‍රියාකාරකම් පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන අතර ඒ සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ මිල්කෝ පුද්ගලික ආයතනය වැනි අනෙකුත් ආයතනවල සහයෝගීතාව ලැබේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- "ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය කඩිනම් කිරීම පිණිස සේවා සැපයුම් පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය ඒකක පිහිටුවීම" සම්බන්ධයෙන් ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව පළාත් මට්ටමින් අවශ්‍ය අමතර කාර්ය මණ්ඩල පත්කිරීමට අදාළ කමිටු රැස්වීම් සඳහා සහභාගි වූ අතර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්තාව සකස් කරන ලදි.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2011 පිළියෙල කිරීම සඳහා 8 වන පරිච්ඡේදය වන "රාජ්‍ය වියදම් සහ ප්‍රතිපත්තිමය දැක්ම සඳහා පශු නිෂ්පාදන වලින් ස්වයංපෝෂිත වීම" අනු පරිච්ඡේදය පිළියෙල කිරීම.
- ඕස්ට්‍රේලියාවෙන් කිරි ගවයින් 500 ක් ගෙන්වීමේ ව්‍යාපෘතිය සඳහා, පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයට තාක්ෂණික සහාය ලබාදීම.
- ව්‍යාපෘති වාර්තා 15 ක් විශ්ලේෂණය කර අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 10 ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.

**වාරිමාර්ග හා ඉඩම්**

2012 වර්ෂයේ වාරි අංශයේ සමස්ත පිරිවැය රු. බිලියන 33 ක් වූ අතර එයින් රු. බිලියන 30 ක් සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන ලදී. 2012 වසරේ ආයෝජන පිරිවැය, 2002 වසරේ ආයෝජන වියදම් වලට සාපේක්ෂව දහතුන් ගුණයකින් වර්ධනය වීමකි. 2006 - 12 කාල පරිච්ඡේදය තුළ නව ජලාශ ඉදිකිරීම (රු.බි. 50) වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම (රු.බි. 30) ජල කළමනාකරණය සහ වාරි පද්ධතිවල මෙහෙයුම්

හා නඩත්තු කිරීම් (රු.බි. 12) සහ ශක්‍යතා අධ්‍යයන හා පර්යේෂණ සිදුකිරීම (රු.බි. 45) වශයෙන් රාජ්‍ය පිරිවැය දරන ලදී.

2012 වර්ෂ තුළ ඉඩම් අංශයේ මුළු පිරිවැය රු.මි. 4,651 ක් වන අතර එයින් රු.මි. 2,235 ක් ආයෝජන වියදම් වේ. 2012 වර්ෂය තුළ ඉඩම් හිමිකම් ඔප්පු ලබාදීමේ වැඩ සටහන (බිම් සවිය) (රු.මි. 417), රාජ්‍ය කටයුතු සඳහා ඉඩම් අත්පත් කරගැනීම (රු.මි. 1,285), සුනාමි කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම (රු.මි. 321) සහ අනෙකුත් සංවර්ධන වැඩසටහන් (රු.මි. 212) ලෙස ආයෝජනය කරන ලදී.

**විශේෂ ක්‍රියාකාරකම්**

- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2011 වාර්ෂික වාර්තාවෙහි වාරිමාර්ග උප පරිච්ඡේදය සඳහා "වාරි ජල කළමනාකරණය" සහ ජල ඉල්ලුම සපුරාලීම යන වගු සටහන සකස් කිරීම.
- දැයට කිරුළ 2012 ප්‍රදර්ශනය සඳහා තොරතුරු පත්‍රිකා පිළියෙල කිරීමට අවශ්‍ය වාරි ක්ෂේත්‍රයේ තොරතුරු සැපයීම.
- දැයට කිරුළ - 2013 ප්‍රදර්ශනය පැවැත්වෙන පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකළපුව සහ අම්පාර යන දිස්ත්‍රික්කවල සැලසුම් සකස් කිරීම සඳහා වාරි ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික යෙදවුම් සහ තොරතුරු සැපයීම.
- කෘෂිකාර්මික ක්ෂේත්‍රයට 2012 නියඟයෙන් සිදු වූ බලපෑම් තක්සේරු කිරීම සහ නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා යෝජිත කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ ජලය රඳවා ගැනීමේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ජලාශ සහ වැව්වල රොන්මඩ ඉවත් කිරීම සහ වැව් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන් සකස් කිරීම.
- වාරි ව්‍යාපෘති යෝජනා 07 ක් සහ උගත්පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ ඉදිරිපත් කළ ඉඩම් අංශයේ ව්‍යාපෘති යෝජනා 03 සඳහා අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
- වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ 14 ක් සඳහා නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කිරීම.
- ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ 03 ක් සඳහා නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කිරීම.
- වෙලි ආරක්ෂණ සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ගංහාධාර සංවර්ධනය සඳහා මූලික සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික යෙදවුම් ලබාදීම.
- මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය සහ වෙලි ආරක්ෂණ සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම් මෙන්ම වාරි අංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වීම.

## 3.2 මහජන උපයෝගිතා

මහජන උපයෝගිතා අංශය යටතට ගැනෙන අමාත්‍යාංශ

1. ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය
2. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
3. ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

<u>ජලසම්පාදන</u>

වසර 2020 වනවිට සැමට ස්ථිරසාර ලෙස පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට අවකාශ ලබා දීම රජයේ අරමුණ වන අතර පානීය ජලය සඳහා ප්‍රවේශ වීම මූලික මානව අවශ්‍යතාවයක් ලෙසද රජය හඳුනාගෙන ඇත. මේ අනුව රජය ත්‍රිවිධ වූ එකිනෙක හා බැඳුනු උපාය මාර්ගික සැලැස්මක් ක්‍රියාවට නංවා ඇත. ඒ යටතේ ජනගහනය වැඩි විසල් නගර, නාගරික ප්‍රදේශ මෙන්ම නැගී එන නගර සඳහා සියලුදෙනාටම නල ජල සම්පාදනය කිරීම පළමු උපාය මාර්ගය වේ. ග්‍රාමීය ප්‍රදේශ සඳහා ප්‍රජාමුල ජල සම්පාදන ව්‍යාපෘති මගින් පිරිසිදු ජලය සැපයීම දෙවන උපාය මාර්ගය වන අතර, ළිං සහ අනෙකුත් ජල මූලාශ්‍රවලත් ජලය ලබා ගන්නා නිවාස සඳහා ජල තත්ත්ව පරීක්ෂණ පහසුකම් ලබා දීම මගින් දායකත්වය ලබා දීම තෙවන උපායමාර්ගය වේ.

<u>විදුලිබල හා බලශක්ති</u>

ඛණිජ තෙල් ගවේෂණ වැඩසටහන් සහ සුලඟ, සූර්ය බලය වැනි විකල්ප බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීම තුලින් බලශක්ති සුරක්ෂිතතාවය ඇති කර ගැනීම දිගුකාලීන අරමුණ වේ. ජාතික විදුලිබල පද්ධතිය තුලින් මෙන්ම එයට පරිබාහිර වූ ක්‍රමවේදයන් තුලින්ද රටේ සෑම නිවසක් වෙතම විදුලිබලය ලබා දීම රජයේ කෙටිකාලීන අරමුණ වේ. ඉහත අරමුණුවල ප්‍රතිඵලයක් ලෙස මෙන්ම වරාය සහ වෙළඳ ජාලයෙහි ස්ථානීය පිහිටීමෙහි වැදගත්කමෙහිද වාසිය රඳවා ගනිමින් ශ්‍රී ලංකාව සියලු ආකාරයේ බලශක්ති අවශ්‍යතා සපුරා කලාපයේ බලශක්ති කේන්ද්‍රය බවට පත්වනු ඇත. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේද වැඩි දායකත්වයක් සහිතව අඩු පිරිවැය බලශක්ති බලාගාර ඉදිකරමින් අඛණ්ඩව විදුලිය සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීමට අපේක්ෂිතය. එසේම බලශක්ති සංරක්ෂණය කළමනාකරණය සහ බලශක්ති හානිය අවම කිරීම සඳහාද අවධානයක් යොමු කරනු ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- වසර 2012 තුළ ව්‍යාපෘති යෝජනා 18 ක් ඇගයීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 11 සඳහා ඍජු නිරීක්ෂණ ලබා දීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ 30 සඳහා සහායක නිරීක්ෂණ ලබා දීම.
- 2012 මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා ක්ෂේත්‍රයට අදාළ පරිච්ඡේදය සැකසීම.
- **" රාජ්‍ය ආයෝජන ප්‍රතිපත්තිය"** සඳහා පරිච්ඡේදය සැකසීම.
- පහත සඳහන් රැස්වීම් සඳහා සහභාගි වීම.

    - ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම්.
    - ජලසම්පාදන හා සනීපාරක්ෂණ ක්ෂේත්‍රයේ ගැටළු සාකච්ඡා කිරීම සඳහා වූ රැස්වීම්.
    - බහු කාර්යය ජලාශ ඉදිකිරීම සඳහා වූ රැස්වීම්.
    - ජාතික ප්‍රජා ජල භාරයේ භාරකරුවකු ලෙස ප්‍රජා ජල භාරයේ රැස්විම්.
    - බලශක්ති සුරක්ෂිතතාව ලඟාකර ගැනීම සඳහා වන අන්තර් අමාත්‍යාංශ කමිටුවේ සාමාජික.

## 3.3 මාර්ග, වරාය, ප්‍රවාහන, තොරතුරු, තාක්ෂණ, මාධ්‍ය, තැපැල්, සහ සන්නිවේදන

**මාර්ග**

රටෙහි සමෘද්ධිය, ඵලදායීතාව සහ සමාජීය දියුණුව සඳහා ප්‍රධානතම හවුල්කරු වෙමින් මාර්ග ජාලය රටෙහි වාහන ප්‍රමාණයෙන් සියයට 95 ක ප්‍රමාණයකට පහසුකම් සපයයි. කැපී පෙනෙන ආයෝජනයන් තුළින් පවත්නා සම්පත් ආරක්ෂා කර ගැනීම, නැගී එන ඉල්ලුමට සරිලන සේ පහසුකම් වැඩිදියුණු කිරීම සහ ලෝක තත්ත්වයන් හා ගැලපෙන පරිදි යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇත.

**වරාය**

ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රධානතම දායකයෙකු ලෙස වරාය අංශය හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ වරායන් මගින් අඩි 20 සම ඒකක මිලියන 4.3 ක ප්‍රමාණයක් වාර්ෂිකව මෙහෙයවමින් ආර්ථික කටයුතු ප්‍රසාරණය සඳහා කැපී පෙනෙන බලපෑමක් ඇති කරයි. වර්තමානයේ කොළඹ සහ හම්බන්තොට යන ජාත්‍යන්තර වරායන් දෙකක් සහ ගාල්ල, ඔළුවිල්, ත්‍රිකුණාමලය, කන්කසන්තුරේ සහ පේදුරුතුඩුව යන ප්‍රාදේශීය වරායන් වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරීව පවතියි.

**ප්‍රවාහන**

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන අවශ්‍යතා සඳහා සුරක්ෂිත, ආරක්ෂාකාරී සහ පහසු සේවාවක් සැපයීම සඳහා වැඩිදියුණු කරන ලද, කාර්යක්ෂම හා විශ්වාසවන්ත ප්‍රවාහන සේවාවක් සැපයීම අරමුණු කරගෙන ඇත. නිරන්තරව වැඩිවන ගොඩබිම් ප්‍රවාහන අවශ්‍යතා මගින්, මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇති පහසුකම්වල අවශ්‍යතාවය මතුකර ඇත. එම නිසා, ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා තිරසාර ලෙස ආයෝජනය කිරීම, ප්‍රවාහන සේවා සඳහා පහසු ප්‍රවේශය නූතන පහසුකම් සහිතව අන්තර් මාධ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා ඉහළ ප්‍රමුඛතාව ලබා දී ඇත.

**තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන**

තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, තැපැල් හා විදුලි සංදේශ යන අංශවලින් තොරතුරු හා සන්නිවේදන අංශය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරණ (ICT/BPO) සහ දැනුම් බාහිරකරණ (ICT/KPO) යන ආදායම් උපයන කර්මාන්ත තොරතුරු තාක්ෂණ අංශයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය දැනුම පාදක කරගත් සේවා අංශයක් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම අංශය තුළ තොරතුරු හා සන්නිවේදන පහසුකම් ඉහළ නැංවීම, තොරතුරු

හා සන්නිවේදන මාධ්‍ය වෙත ළඟාවීම පහසු කිරීම, ඉ-රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට වැදගත්වන නීතිමය පසුබිම සැකසීම යන කරුණු කෙරෙහි රජය මූලික අවධානය යොමු කරන අතර පද්ධති වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් සේවා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම තුළ පෞද්ගලික අංශය අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 51 ක් ඇගයීමට ලක්කර ඇත.
- මාර්ග, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ අංශ සඳහා ව්‍යාපෘති නාමාවලිය (Project Pipeline) සකස් කිරීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.
- 2013-2016 රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා, මාර්ග, වරාය, ගුවන්, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන යන පරිච්ඡේද සකස් කිරීම.
- ප්‍රමුඛතා අංශ පාදක කර ගනිමින් 2014-2016 කාල සහ ප්‍රතිඵල දර්ශක සකස් කිරීම.
- 2013-2016 කාලය සඳහා රාජ්‍ය ආයෝජන සැකැස්ම පිළියෙල කිරීම.
- වරාය හා මහාමාර්ග, සිවිල් ගුවන් සේවා, ප්‍රවාහන, විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ, තැපැල් හා ජනමාධ්‍ය යන අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ සැපයීම.
- වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් 33 ක්, ප්‍රවාහන සහ ගුවන් සේවා අංශවලින් 22 ක් සහ විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ, තැපැල් හා මාධ්‍ය අංශවල 8 ක් ලෙස අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 63 කට නිරීක්ෂණ සපයා ඇත.
- 2012 වාර්ෂික වාර්තාව සඳහා මාර්ග, ප්‍රවාහන සහ තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අංශවල උප පරිච්ඡේද සැකසීම.
- දැයට කිරුළ වැඩසටහන සඳහා අදාළ ආංශික ලේඛන සැකසීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2012 ප්‍රගති වාර්තාව සඳහා මාර්ග, ප්‍රවාහන සහ තොරතුරු හා සන්නිවේදන අංශයන්හි පරිච්ඡේද සැකසීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සඳහා අවශ්‍ය සහාය ලබාදීම.
- රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති 51 ක් ඇගයීම් සිදුකර නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී
- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමේදී රේඛීය අමාත්‍යාංශ සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම.
- මාර්ග, ප්‍රවාහන සහ තොරතුරු තාක්ෂණ අංශ සඳහා 2013-2016 රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කිරීම.

## 3.4 කර්මාන්ත, වෙළඳ සහ වැවිලි

<u>කර්මාන්ත හා වෙළඳ</u>

පසුගිය කාල පරාසය තුළ අනුගමනය කරන ලද කර්මාන්ත හිතකාමී ප්‍රතිපත්ති හේතුවෙන් 2011 වසරේදී කර්මාන්ත අංශය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ලද දායකත්වය සියයට 29.3 ක අගයක සිට 2012 වසරේදී සියයට 30.4 දක්වා ඉහළ යන ලදි. එම ක්‍රියාමාර්ගයන් අතර කර්මාන්ත හිතකාමී බදු ක්‍රමය, ප්‍රාදේශීය කර්මාන්ත කලාප පිහිටුවීම, බදු සහන ලබාදීම, අපනයනකරුවන් දිරිමත් කිරීම සඳහා දිරිදීමනා ලබාදීම, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණික හා මූල්‍යාමය පහසුකම් ලබාදීම මූලික ක්‍රියාමාර්ග වේ.

**2012 වසරේදී කර්මාන්ත අංශයේ කාර්යසාධනය**

| කාර්මික අපනයන | අපනයන වටිනාකම් (එ.ජ.ඩො. මිලියන) |
|---|---|
| රෙදිපිළි හා ඇඟලුම් | 3,965 |
| රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ | 857 |
| දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ | 559 |
| ආහාරපාන හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන | 360 |

*මූලාශය: ශ්‍රී ලංකා අපනයන මණ්ඩලය*

**2010-2012 කාලය තුළ කර්මාන්ත අංශයේ ප්‍රගතිය**

| අයිතමය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය | 1,649.3 | 1,956.6 | 2,387.7 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 28.7 | 29.3 | 30.4 |
| ආංශීය වර්ධන වේගය | 8.4 | 10.3 | 10.3 |
| රැකියා නියුක්තිකයින් (මිලියන) | 1.8 | 2.0 | 2.1 |
| රැකියා නියුක්තිය සමස්ත ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස | 24.6 | 24.1 | 26.1 |
| නිෂ්පාදන අංශය සඳහා සෘජු විදේශීය ආයෝජන ගලාඒම් (එ.ජ.ඩො.මිලියන) | 159.7 | 322.4 | 307.66 |
| කාර්මික ධාරිතා ප්‍රයෝජ්‍යකරණයේ වේගය | 82 | 83 | 84 |
| කර්මාන්ත ආශ්‍රිත අගය එකතු කිරීම (රු. බිලියන) | 913 | 1,084 | 1,233 |
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ වන කාර්මික ජනපද සංඛ්‍යාව | 27 | 25 | 26 |

**විශේෂ ක්‍රියාකාරකම්**

- 2012 වසරේදී ව්‍යාපෘති 18 ක් ඇගයීම.
- කර්මාන්ත අංශය ආශ්‍රිත අමාත්‍ය මණ්ඩල සංදේශ 14 කට නිරීක්ෂණ සැපයීම.
- ශ්‍රී ලංකාවේ උළු කර්මාන්තයෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව අධ්‍යයනයක් සිදුකළ අතර උපායමාර්ගික සැලසුමක් සකස් කිරීම සඳහා දත්ත රැස්කිරීම.
- එප්පාවල පොස්පේට් නිධිය භාවිතයට ගනිමින් ත්‍රිත්ව සුපර් පොස්පේට් නිෂ්පාදනය කිරීමේ ශක්‍යතාවය පිළිබඳ අධ්‍යයනය කිරීම හා ඒ ඇසුරෙන් භාණ්ඩාගාර ලේකම්තුමා දැනුවත් කිරීමට සටහනක් ඉදිරිපත් කිරීම.
- කාර්මික ජනපද සඳහා ඉඩම් ලබාදීමේ වත්මන් ක්‍රියාදාමය පිළිබඳ අධ්‍යයනය කළ අතර ඒ සම්බන්ධයෙන් වන ප්‍රමාදයන් අවම කිරීම පිළිබඳ සාකච්ඡා තවදුරටත් පැවැත්වේ.
- ඖෂධ නිෂ්පාදන කර්මාන්තය සඳහාම විශේෂිත වූ කර්මාන්ත කලාපයක් පිහිටුවීම සඳහා අවශ්‍ය වන මූලික පියවර ගැනීම.

<u>වැවිලි</u>

තේ, රබර්, පොල් සහ අපනයන කෘෂි බෝග වලින් සමන්විත වන වැවිලි අංශයට රටේ ආර්ථිකයේ වැදගත් තැනක් හිමිවේ. එමගින් සියයට 2.6 දායකත්වයක් රටේ දළ ජාතික නිෂ්පාදනයට ලබාදෙන අතර මිලියන 1.5 කට පමණ සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ලබාදෙනු ඇත. වැවිලි අංශය හා සම්බන්ධ ක්‍රියාකාරකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය හා සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එක්ව සිදු කරන ලදී.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති 18 ක් ඇගයීම් සිදුකරන ලද අතර අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා අදාළ අමාත්‍යාංශ වෙත යොමු කරන ලදී.
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, පොල් සංවර්ධන අමාත්‍යාංශය හා සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශ වලින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 09 ක් සඳහා නිරීක්ෂණ සකස් කරන ලදී.
- කුඩා තේ වතු ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම්, ව්‍යාපෘති, ප්‍රගති සමාලෝචන රැස්වීම්, අයවැය සාකච්ඡා ඇතුළු රැස්වීම් 15 කට සහභාගී වීම.
- වැවිලි අංශය හා සම්බන්ධ 2013-2015 රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කිරීම.
- අපනයන කෘෂි බෝග පැල මිල ගණන් සංශෝධනය පිළිබඳ යෝජනාව ඇගයීම .
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2012 වාර්ෂික වාර්තාවේ පරිච්ඡේද 8.6.2 සකස් කිරීමට අවශ්‍ය විස්තර ලබාදීම.

## 3.5 සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා, ක්‍රීඩා, නිවාස සහ නාගරික සංවර්ධන

**<u>සංස්කෘතික, ආගමික, ජාතික ඒකාබද්ධතා සහ ක්‍රීඩා</u>**

සංස්කෘතික කටයුතු, පුරාවිද්‍යා, ජාතික කෞතුකාගාර, ජාතික ලේඛනාරක්ෂණ, බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා මුස්ලිම් කටයුතු, ක්‍රීඩා සංවර්ධනය, රාජ්‍ය භාෂා සහ සමාජ ඒකාබද්ධතා යන ක්ෂේත්‍ර මෙම අංශය මගින් ආවරණය කරනු ලැබේ. අමාත්‍යාංශ 05ක් මීට ඇතුලත් වේ.

(i) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

(ii) ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

(iii) බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය

(iv) ක්‍රීඩා අමාත්‍යාංශය

(v) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

**විශේෂ ක්‍රියාකාරකම්**

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 18 කට නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- 2012 වසර තුළ ව්‍යාපෘති වාර්තා 20 අනුමත කිරීම.
- 2012 දැයට කිරුළ ජාතික වැඩසටහන සඳහා අත්පත්‍රිකා සැකසීමට සහාය වීම.
- 2012-2015 රාජ්‍ය ආයෝජන සැලැස්ම සැකසීම සඳහා දායක වීම.
- 2011 වාර්ෂික වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- 2013 අයවැය සාකච්ඡා සඳහා දායකත්වය ලබා දීම.
- 2012 දස අවුරුදු ත්‍රෛයිභාෂා ජාතික සැලැස්ම සැකසීමට දායක වීම.
- ක්‍රීඩා ප්‍රතිපත්තිය සැකසීම සඳහා නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීම.
- උතුරු නැගෙනහිර පළාත්වල පැරණි බෞද්ධ සිද්ධස්ථාන හින්දු කෝවිල් සහ බලකොටු පොකුරු ලෝක උරුම ස්ථාන ලෙස ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවය සඳහා වාර්තාවක් සකස් කිරීමට අමාත්‍යාංශය යටතේ පත්කරන ලද කමිටුවට සහභාගි වීම සහ එම වාර්තාව සැකසීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

**<u>නිවාස හා නාගරික සංවර්ධනය</u>**

නිවාස හා නාගරික සංවර්ධනය පිළිබඳ කටයුතු මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි. රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් මෙම අංශයේ කටයුතු කර ගෙන යනු ලැබේ.

මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව, ඉලක්ක සපුරා ගැනීම සඳහා නිවාස හා නාගරික සංවර්ධන අංශය විවිධ මානයන් යටතේ ක්‍රියා කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජීවත්වන සියළුම පවුල් සඳහා සුදුසු නිවසක ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීමත්, හිතකර පරිසරයක් ඇති කරමින් පෞද්ගලික අංශයේ ආයෝජන නිවාස සංවර්ධනය සඳහා දිරිමත් කිරීමත් නගර හා පුරවර සුදුසු පරිදි සංවර්ධනය කිරීමත් රාජ්‍ය නිවාස හා නාගරික සංවර්ධන ප්‍රතිපත්තියෙහි අරමුණයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ඉහත ප්‍රතිපත්තිය ක්‍රියාවෙහි නැංවීම සඳහා ව්‍යාපෘති 42 ක් ඇගයුමට ලක් කොට ඉන් 34 ක් ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. ව්‍යාපෘති සම්බන්ධ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදී.

- රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 26 ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී.

- නිවාස හා නාගරික සංවර්ධන අංශයට අදාළ 2013-2015 වර්ෂ සඳහා වන රාජ්‍ය ආයෝජන සැලැස්ම සකස් කරන ලදී.

- නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ප්‍රමුඛතාගත කිරීම සඳහා 2012 වර්ෂය පුරා රැස්වීම් මාලාවක් සංවිධානය කරන ලදී.

- 2012 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා සාකච්ඡා කිහිපයක් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය සමඟ පවත්වන ලදී.

- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සකස් කිරීම සඳහා නිවාස හා නාගරික සංවර්ධන ක්ෂේත්‍රය සම්බන්ධ ලේඛන සකස් කරන ලදී. (පරිච්ඡේද 8.4.7 සහ 8.5.6)

- 2012 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නිවාස හා නාගරික සංවර්ධන ක්ෂේත්‍රය සම්බන්ධ තොරතුරු ලබා දීම.

## 3.6 අධ්‍යාපන හා සෞඛ්‍ය

අධ්‍යාපන

අධ්‍යාපන ප්‍රතිපත්ති ඉලක්ක කරනුයේ නවීන සමාජයේ අභියෝගයන්ට මුහුණ දීමට අවශ්‍ය දැනුම හා නිපුණතාව සහිත ළමුන් බිහි කිරීමට හැකි ගුණාත්මක හා ළමා මිතුරු අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමයි. එසේම ශ්‍රී ලංකාව අඩු ආදායම් රටක්ව සිට මැදි ආදායම් ලබන රටක් දක්වා වර්ධනය වීමට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරීත්වය ඉතා ප්‍රබල වේ. විශ්වවිද්‍යාල පද්ධතිය හරහා රටට වැඩදායී ලෙස සේවය කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙරට විශ්වවිද්‍යාල ලෝකයේ පිළිගත් විශ්වවිද්‍යාල බවට පත් කිරීමට රජය සැළසුම් කර ඇත.

සෞඛ්‍ය

සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ රජයේ අරමුණ වන්නේ රටෙහි සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායක විය හැකි සෞඛ්‍ය සම්පන්න/නිරෝගිමත් ජාතියක් බිහිකිරීමය. ඒ සඳහා ප්‍රාදේශීය වශයෙන් පිහිටි රෝහල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහි රජයේ විශේෂ අවධානයක් යොමුකර ඇත.

සේවය සලසන අවස්ථාවේදී එය නොමිලයේ ලබා දෙමින් රෝග වලක්වා ගැනීමේ සිට රෝග නිවාරණය දක්වා වූ සියළු සේවා අවශ්‍යතා සපුරාලමින් සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ගැටළු නිසි ලෙස කළමනාකරණය කරමින් රෝගීන්ගේ සෞඛ්‍ය අවශ්‍යතා එල්ල කරගත් සේවා ක්‍රමයක් බවට සෞඛ්‍ය සේවාව පත්කිරීම ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂණ ක්‍රමයෙන් අපේක්ෂිතය.

දිනෙන් දින වර්ධනය වන බෝනොවන රෝග, බෝවන රෝග සහ විවිධ ජන කණ්ඩායම්වල පෝෂණ ගැටළු ආශ්‍රයෙන් මතුව ඇති අවශ්‍යතා සඳහා ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ලබාදීම රජයේ විශේෂිත ඉලක්කය වී තිබේ. සියළු රෝහල්, නවීන වෛද්‍ය උපකරණ, ගිලන් රථ, අත්‍යවශ්‍ය ඖෂධ සහ අවශ්‍ය වෛද්‍ය වෘත්තිකයන් ඇතුළු සියළු වෛද්‍ය පහසුකම් සහිත අංග සම්පූර්ණ රෝහලක් බවට පත්කිරීම තුළින් ප්‍රාථමික හෝ තෘතියික යන ඕනෑම මට්ටමක රෝහලකින් සැපයෙන සේවාවන් පිළිබඳ ජනතාව තෘප්තිමත් කිරීම රජයේ අපේක්ෂාවයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ වල ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සකස් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීම.
- 2013 – 2017 සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධන සැලැස්ම හා 2012 – 2016 සඳහා වූ අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් රාමුව සකස් කිරීමට සහය වීම.
- 2013 – 2016 රාජ්‍ය ආයෝජන සැලැස්මෙහි සෞඛ්‍ය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන පරිච්ඡේද සකස් කිරීම.
- 2013 – 2016 රාජ්‍ය ආයෝජන වගුව සකස් කිරීම.
- ක්ෂේත්‍රයේ ගැටළු විශ්ලේෂණය කිරීම.
- සෞඛ්‍ය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.

- අධ්‍යාපන ක්ෂේත්‍රයේ අමාත්‍ය මණ්ඩල සංදේශ 26 ක් හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අමාත්‍ය මණ්ඩල සංදේශ 33 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ ව්‍යාපෘති වාර්තා 22 ක් හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ව්‍යාපෘති වාර්තා 23 ක් සඳහා නිරීක්ෂණ ලබා දීම.

<u>නිපුණතා අධ්‍යාපන අංශය</u>

රටෙහි මානව සම්පත් සංවර්ධනයේ ප්‍රධාන අංගයක් වන්නේ නිපුණතා අධ්‍යාපන අංශයයි. එම නිසා රජයේ දර්ශනය වන්නේ රටෙහි  තරුණ/තරුණියන් සියළුම දෙනාට නිපුණතා අධ්‍යාපනය ලබාදීමයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති යෝජනා 51 ක් ඇගයීමට ලක් කරන ලද අතර එයින් 16 ක් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කරන ලදී. නිර්දේශ කරන ලද ව්‍යාපෘතීන්හි මුළු වටිනාකම රුපියල් මිලියන 3,568.81 කි. එම ව්‍යාපෘතීන්ට අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.  ඊට අමතරව ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යායතනය ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාව සඳහා නිර්දේශ ලබාදෙන ලදී. එහි මුළු වටිනාකම රුපියල් මිලියන 7,200 කි.
- යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදී.
- 2013-2015 කාලය සඳහා නිපුණතා අධ්‍යාපන අංශයට අදාළව රාජ්‍ය ආයෝජන වැඩසටහන සකස් කරන ලදී.
- ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන සැලසුම් කිරීම පිලිබඳව රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් රුපියල් මිලියන 200 ක ආයෝජනයක් කිරීමට බලාපොරොත්තු වේ.
- පුද්ගලික අංශයේ සහභාගිත්වයද ඇතිව නිපුණතා සංවර්ධන අංශයේ සැලැස්ම සකස් කිරීම සඳහා රටෙහි විවිධ උපායමාර්ගික විදේශීය සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා වාර කිහිපයක් පවත්වන ලදී.
- කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයක් ස්ථාපිත කිරීම සම්බන්ධව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වන ලදී.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සකස් කිරීම සඳහා නිපුණතා අධ්‍යාපන අංශයට සම්බන්ධව අවශ්‍ය වන මූලික දත්තයන් හා තොරතුරු ලබාදෙන ලදී.
- නිපුණතා අධ්‍යාපන අංශයට අදාළව දැයට කිරුළ වැඩසටහන සඳහා අවශ්‍ය වන්නා වූ තොරතුරු ලබාදෙන ලදී.

## 3.7 පරිසර, තාක්ෂණ සහ පර්යේෂණ, ධීවර, සංචාරක

**පරිසර**

ඉදිරි පරම්පරාව සඳහා ස්වාභාවික උරුමය ලබාදීම, භූමිය, සත්ව හා ශාක ප්‍රජාව සමග සහයෝගයෙන් කටයුතු කළ හැකි තිරසාර සංවර්ධනයක් ඇති කිරීම රජයේ පාරිසරික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව පරිසරය සංරක්ෂණය කිරීම තිරසාර පරිසර සංවර්ධනයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ව්‍යාපෘති ඇගයීමේදී 2012 වර්ෂය තුළදී රජය ප්‍රධාන පාරිසරික අභියෝගයන් වන, වන ආවරණය අඩුවීම, වායු හා ජල දූෂණය, දේශගුණ විපර්යාස, භූමි හායනය, අලි මිනිස් ගැටුම වර්ධනය වීම හා වෙරළ ඛාදනය ජය ගැනීම සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබීය.

**තාක්ෂණ හා පර්යේෂණ**

තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රය ලෝක මට්ටමට ගෙන යාම රජයේ ප්‍රධාන අරමුණක් වේ. රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි ඉහළ තාක්ෂණික කර්මාන්ත ක්ෂේත්‍රය විශාල දායකත්වයක් දක්වනු ලබයි. ඉහළ තාක්ෂණික කර්මාන්ත ප්‍රවර්ධනය තුලින් දේශීය කර්මාන්තවල ගුණාත්මකභාවය, ඵලදායීතාවය හා තරඟකාරිත්වය වැඩි කිරීමට රජය විසින් දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇත. පසුගිය වසර කිහිපයේදී සිදුකරන ලද නැනෝතාක්ෂණය, ජෛව තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හි පර්යේෂණ තුලින් ආහාර සැකසීම, පටක විද්‍යාව හා පොහොර යන අංශයන්හී ප්‍රවර්ධනයක් පෙන්වා ඇත.

**වනාන්තර**

වර්තමාන වන ආවරණය හෙක්ටයාර මිලියන 1.95 කි. එය මුළු බිම් ප්‍රමාණයෙන් 28% කි. මෙම වන ආවරණයෙන් හෙක්ටයාර් මිලියන 1.2 ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින අතර ඉතිරි හෙක්ටයාර් මිලියන 0.75 ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතී. වර්තමානයේදී කෘෂිකර්මාන්තය, හේන් ගොවිතැන, අනවසර ගස් කැපීම්, ලැව්ගිනි හා ගව පාලනය වැනි ක්‍රියා නිසා සිදුවන වනහරණය හේතුවෙන් දැනට පවතින වන ආවරණය සීඝ්‍ර පහත වැටීමක් පෙන්වයි. මෙය වලක්වා ගැනීම සඳහා විනාශයට ලක් වූ වනාන්තර පුනරුත්ථාපනය හා ප්‍රතිෂ්ඨාපනය කිරීම මෙන්ම තවදුරටත් මෙම වන හානිය වලක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම වැදගත් වේ.

**වනජීවී සංරක්ෂණය**

දැනට පවතින දේශීය වනජීවී විශේෂ වඳ වී යාමේ තර්ජනයකට ශ්‍රී ලංකාව මුහුණ පා ඇත. මේ හේතුවෙන් ලෝකයේ ජෛව විවිධත්වයෙන් ඉහළම තැනක පවතින ලංකාවේ මෙම ජීවී විශේෂ ආරක්ෂා කර ගැනීම වනජීවී සංරක්ෂණයේ මූලික අරමුණ වන අතර මේ සඳහා ඔවුන්ගේ ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම මෙහි මූලික ක්‍රමෝපාය වේ. අලි මිනිස් ගැටුම ලංකාව දැනට මුහුණපාන ප්‍රබලම ගැටළුවකි. මෙයට ප්‍රධානම හේතුව වී ඇත්තේ සංවර්ධන වැඩසටහන් මගින් වන අලින්ගේ ස්වභාවික පරිසරය ක්‍රමයෙන් අහිමි වී යාමයි.

**<u>වෙරළ සංරක්ෂණය</u>**

ජල මට්ටමේ සිට මීටර් 300 ක් තෙක් ගොඩබිමට වෙතට දිවෙන බිම් තීරය වෙරළ නම් වේ. ස්ථිරව හෝ කලින් කලට හෝ මුහුදට ගලා බසින ගංගා, ඇලදොල, කලපු හෝ වෙනත් දියපහරවල්ද මෙයට ඇතුළත් වේ. ලංකාව වටා පැතිර ඇති මුහුදු තීරයේ දිග කිලෝ මීටර් 1,585 කි. වැලි සහිත වෙරළ, පුනීල මෝය, කලපුව, මුහුදු තෘණබිම්, කොරල් පර, කඩොලාන හා වැලිපර වලින් මෙය සමන්විත වේ. ජනගහන වර්ධනය සමඟ වෙරළ සම්පත්වලට වන බලපෑම් ඉහළ ගොස් ඇත. කර්මාන්ත සංවර්ධනය, වෙරළ ආශ්‍රිත සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය සහ විවෘත ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම් වෙරළ තීරයේ හානියට මෙන්ම වෙරළ සංවර්ධන ආශ්‍රිත ගැටළුවලට හේතු වේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- 2012 වසරේදී ලැබුනු මුළු ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව 14 කි. එයින් නවයක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන්ද, හතරක් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන්ද, එකක් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන්ද ලැබුණි. පවත්නා මූල්‍ය සම්පත් ප්‍රමාණය සහ එක් එක් අංශයේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන මෙම ව්‍යාපෘති යෝජනාවලින් කිහිපයක් 2013 වසර සඳහා නිර්දේශ කරන ලදී. එක් ව්‍යාපෘති යෝජනාවක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නිර්දේශ කර ඉදිරිපත් කරන ලද අතර ඉතිරි ව්‍යාපෘති ඉදිරි වර්ෂ සඳහා නිර්දේශ කිරීමට බලාපොරොත්තු වේ.

- 2012 වසරේදී අමාත්‍ය මණ්ඩල සංදේශ 10 කට නිරීක්ෂණ යවන ලදී. මෙයින් අටක් ගොවිජන සේවා හා වනජීවි සංරක්ෂණ අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ වන අතර දෙකක් පරිසර අමාත්‍යාංශයට අයත් වේ.

- පරිසර අමාත්‍යාංශයේ පවත්වන ලද ව්‍යාපෘති යෝජනා ඇගයීමේ සාකච්ඡා කිහිපයකට සහභාගි වීම.

- ගොවිජන සේවා හා වනජීවි සංරක්ෂණ අමාත්‍යාංශයේ පැවැති " 2013 අයවැය සාකච්ඡාවට " සහභාගි වීම.

- පරිසර අමාත්‍යාංශයේ පැවැති " 2013 අයවැය සාකච්ඡාවට " සහභාගි වීම.

- 2011 වාර්ෂික වාර්තාවට අවශ්‍ය වනජීවි, වන සංරක්ෂණ හා වෙරළ සංරක්ෂණ අංශවලට අදාළ කරුණු ලබා දීම.

- දැයට කිරුළ වැඩසටහනට අවශ්‍ය වනජීවි හා වන සංරක්ෂණ අංශවලට අදාළ කරුණු ලබා දීම.

## ධීවර

ධීවර අංශය දළ ජාතික නිෂ්පාදනයට සියයට 1.3 ක පමණ දායකත්වයක් දක්වන අතර 530,000 කට පමණ රැකියා අවස්ථා ලබා දී ඇත. මෙමගින් 2012 වසරේදී රු. මිලියන 26,363 ක පමණ අපනයන ආදායමක් ලැබුණු අතර රු. මිලියන 17,402 පමණ වටිනාකමක් සහිත මෙට්‍රික් ටොන් 71,415 ක් පමණ වන ආනයනය කරන ලද මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන ප්‍රමාණයක් මත යැපේ. රටෙහි බහුලව පවතින මත්ස්‍ය සහ ජලජ සම්පත් ප්‍රමාණය සහ ආනයන ප්‍රමාණය පිළිබඳව සැලකීමේදී, මෙම අංශය තවදුරටත් ව්‍යාප්ත කිරීමේ සැලකිය යුතු විභවතාවක් පවතියි.

ධීවර අංශය සඳහා 2012 වසරේ සමස්ත රාජ්‍ය ආයෝජනය රු. මිලියන 2,929 ක් වන අතර එයින් රු. මිලියන 1,910 ක් මූලධන වියදම් වේ. මෙම අංශයෙහි සංවර්ධන විභවය හඳුනා ගනිමින්, රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙල මගින් දිවයින පුරා ධීවර වරාය පද්ධතිය නංවාලීම, ගබඩා හා වෙළඳපල යටිතල පහසුකම් සපයාදීම, ධීවර බෝට්ටු සහ ආම්පන්න සැපයීම, වෙරළබඩ මුහුදු තීරවල හා ගැඹුරු මුහුදේ ජලජීවී වගාව සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා මූල්‍ය සහයෝගීතාව ලබාදීම මෙන්ම නිවාස සහ සමාජීය පහසුකම් නංවාලීමද සිදුකරනු ලබයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- "දැයට කිරුළ ප්‍රදර්ශනය - 2012" සඳහා අත්පත්‍රිකා පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සහ තොරතුරු සපයන ලද අතර ඊට අදාළව පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකළපුව සහ අම්පාර දිස්ත්‍රික් සැලසුම් පිළියෙල කිරීම.
- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2011 වාර්ෂික වාර්තාවේ "නවීන ධීවර කර්මාන්තයක් සඳහා" යන ධීවර අනු පරිච්ඡේදය පිළියෙල කිරීම.
- ව්‍යාපෘති වාර්තා 8 ක් විශ්ලේෂණය කර අදාළ නිරීක්ෂණයන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීම.
- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 5 ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.

## සංචාරක

සංචාරක කර්මාන්තය දැනට ආර්ථිකයේ 6 වන විශාලතම විදේශ විනිමය උත්පාදන මාර්ගය වේ. 2012 වසරේ මෙම කර්මාන්තයේ සමස්ත විදේශ විනිමය උත්පාදනය එ.ජ.ඩොලර් බිලියනයක් විය.

2012 වසර අවසානය වන විට මෙරට පැවති ලියාපදිංචි සංචාරක හෝටල් ගණන 269 ක් වූ අතර ඒවා කාමර 15,510 කින් සමන්විත විය. 2012 වසර තුළ සංචාරකයින් මිලියනයක් මෙරටට පැමිණි අතර එක් සංචාරකයකුගේ දිනක සාමාන්‍ය වියදම එ.ජ. ඩොලර් 100 ක් විය.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති සම්පාදනය හා අවශ්‍ය මඟපෙන්වීම් හරහා සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට දායක විය. ඒ අනුව 2012 වසර තුළ "තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය" කෙටුම්පත් කිරීම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබූ අතර, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ද ලබා ගන්නා ලදි. මීට අමතරව "හැමිල්ටන් ඇළ සංවර්ධන ව්‍යාපෘතිය" දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට ද අනුමැතිය ලබාදෙනු ලැබිණි. තවද, සංචාරක සංවර්ධන කටයුතු වලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 05 ක් සඳහා නිරීක්ෂණ සහ අදහස් ඉදිරිපත් කරනු ලැබිණි.

## 3.8 සාර්ව ආර්ථික, කම්කරු සබඳතා, සමාජ ආරක්ෂණ, බන්ධනාගාර සහ ප්‍රාදේශීය සංවර්ධන

<u>සාර්ව ආර්ථික හා කම්කරු සබඳතා</u>

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම, පවත්නා සාර්ව ආර්ථික ප්‍රශ්න හා ගැටළු හදුනා ගැනීම, සමාලෝචනය හා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සාර්ව ආර්ථික සැලසුම් හා කම්කරු සබඳතා අංශයේ වගකීම වේ. මෙම අංශය මගින් දළ ජාතික නිෂ්පාදනය, සේවා නියුක්තිය, උද්ධමනය හා ගෙවුම් ශේෂය ආදි සාර්ව ආර්ථික විචලායයන් හා බැදුණු කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය යටතේ ශ්‍රී ලංකාවේ සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා යෙදවුම් - නිමැයුම් වගු සහ ඡායා මිල සැකසීම සඳහා වු රැස්වීම් සම්බන්ධිකරණය කිරීමද මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 23කට හා ව්‍යාපෘති යෝජනා 12 ක් සඳහා නිරික්ෂණ ඉදිරිපත් කර ඇත.
- මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ අදාළ අංශයන් සම්පුර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සපයන ලදි.
- දැයට කිරුළ 2013 යටතේ අම්පාර දිස්ත්‍රික්කය සඳහා ආයෝජන සැලැස්ම සකස් කිරීම.
- පොලොන්නරුවේ පැවති දැයට කිරුළ 2013 ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා සහභාගි වීම.
- මහින්ද චින්තනය - ඉදිරි දැක්ම 2011-2016 හා සම්බන්ධ ප්‍රගති වාර්තාවක් සැකසීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව මහින්ද චින්තන ඉදිරි දැක්ම සම්බන්ධයෙන් විස්තරාත්මක ප්‍රගති වාර්තාවක් සකස් කරන ලදී.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2013-2015 (ආංශික සටහන්)
- රාජ්‍ය ආයෝජන වැඩසටහන 2013-2015 සඳහා සංක්ෂේපණය හා කම්කරු හා විදේශ රැකියා යන පරිච්ඡේදයන් සකස් කර ඉදිරිපත් කිරීම.
- උගන්ඩා සංඛ්‍යාලේඛන කාර්යාංශයේ දූත පිරිස සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා රැස්වීමක් සංවිධානය කිරීම.
- මධ්‍යකාලීන ප්‍රාග්ධන අයවැය රාමුව 2013-2015 සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම.
- ප්‍රධාන සාර්ව ආර්ථික හා ආංශිය ඉලක්ක 2013-2015 සැකසීම.
- ටෙන්ඩර් මණ්ඩල, මෙහෙයුම් කමිටු, අධ්‍යක්ෂ මණ්ඩල සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වීම.
- සංවර්ධන සහයෝගිතා ආයතන සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

**<u>සමාජ ආරක්ෂණ</u>**

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ ආරක්ෂණය වැඩ පිළිවෙල මගින්, වයස්ගතවීම, කාලගුණ විපර්යාස, බෝනොවන රෝග ආදි අහිතකර තත්වයන් සමනය කිරීම සඳහා මනා අවධානයක් යොමුකර ඇති අතර ඒ සඳහා අවශ්‍ය නීතිමය මගපෙන්වීමද සිදුකරයි. සමෘද්ධි, පොහොර, විදුලි සහ ඉන්ධන සහනාධාර සැපයීම වැනි දැවැන්ත වැඩසටහන් මඟින් සමාජයේ පිඩාවට පත්වූවන්ගේ සුභසාධනය වෙනුවෙන් රජය සෘජුව මැදිහත් වී ඇති අතර ඒ සඳහා දැනටමත් විශාල මුදලක් වැය කරයි. තවද රජය විසින් දියත් කර ඇති සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල මඟින් කාන්තාවන් බලගැන්වීම, ළමුන් සඳහා අවස්ථාවන් ලබාදීම, වැඩිහිටියන්ගේ අත්දැකීම් සහ දැනුම හුවමාරු කරගැනීම සහ ආබාධිත තත්වයට පත් පුද්ගලයින් සමාජ ප්‍රවාහයට අනුගත කිරීම වැනි ප්‍රමුඛතා අංශ කෙරෙහි විශේෂ මැදිහත්වීමක් දක්වනු ලැබේ. ඒ අනුව ජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීම සඳහා 2012 වසර තුලදී රජය රු.මි.203,881 ක් වැයකොට ඇත.

**විශේෂ ක්‍රියාකාරකම්**

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ අංශය මගින් රජයේ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි දේශීය හා විදේශීය අරමුදල් ව්‍යාපෘති 10 ක් අනුමත කොට ඇත.
- රටේ සංවර්ධනය සඳහා දිළිඳු බව පිටුදැකීම සහ සමාජ ආරක්ෂණය වෙනුවෙන් විශේෂ ප්‍රතිපත්ති තීරණ රැසක් ගැනීමට සමාජ ආරක්ෂණය අංශය විසින් 2012 වසර තුල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 11 ක් සඳහා නිරීක්ෂණ සපයා ඇත. (සෘජු සහ සහාය නිරීක්ෂණ)
- සමාජ සේවා අමාත්‍යාංශයේ පවුල් ප්‍රතිපත්තිය සහ සමාජ ආරක්ෂණ විධික්‍රම සකස් කිරීම සඳහා සහභාගී වීම.
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සකස් කළ මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ඉහළ නැංවීම ජාතික ක්‍රියාකාරී සැලැස්ම විමර්ශනය සහ ඇගයීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම.

**<u>ප්‍රාදේශීය සංවර්ධනය</u>**

නාගරික ප්‍රදේශ වලට පමණක් නැඹුරු වූ සමස්ත සංවර්ධන ක්‍රියාවලිය සහ පසුගිය දශක කිහිපය තුළ ග්‍රාමීය සංවර්ධන මූලාරම්භයන්හි පැවති දූර්වලතා හඳුනා ගනිමින් පවුල, ගම, නගරය සහ පළාත්, ආර්ථිකයේ ප්‍රධාන ධාරාවන්ට සම්බන්ධ කරමින් නව ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශයක් රජය විසින් ආරම්භ කරන ලදි.

පළාතක සංවර්ධන වැඩි දියුණු කිරීම් සඳහා අරමුදල් ප්‍රතිපාදනය පමණක් සිදු කරන ගතානුගතික සංවර්ධන ප්‍රවේශය වෙනුවට රජයේ නව සංවර්ධන මාදිලියේ මූලික පදනම වන්නේ ප්‍රාදේශීය සම්පත් යොදා ගැනීමේ විභවයන් වර්ධනය කිරීම තුළින් ප්‍රාදේශීය ආර්ථික වර්ධනය හා සංවර්ධනය ළඟා කර ගැනීම වේ. මෙම සන්දර්භය යටතේ ප්‍රාදේශීය සංවර්ධන කාර්යයේදී රජය සිදු කරන ප්‍රධාන මැදිහත්වීම වන්නේ පවතින සම්පත් හඳුනා ගැනීම හා ඒවා සංවර්ධන කටයුතු සඳහා යෙදවීමේදී ප්‍රාදේශීය සංවර්ධනයේ ප්‍රධාන භූමිකාවන්හි නියැලෙන ආයතන හා පුද්ගලයන් මනාව සම්බන්ධීකරණය කිරීම වේ.

සියළුම පළාත් වෙත එක හා සමාන අවස්ථාවන් සහතික කරන අඩිතාලමක් ඇති කරමින්, ප්‍රාදේශීය ආර්ථිකයන්ගේ අභිවෘද්ධිය සඳහා වන ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කිරීමත් අන්තර් පළාත් සබඳතාවයන් වැඩි දියුණු කිරීමත් ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීමත් සඳහා රජයේ සංවර්ධන වැඩසටහනෙහි ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී තිබේ. ඒ අනුව, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ ප්‍රදේශ 09ක් ඉලක්ක කරගත් සංවර්ධන වැඩසටහන් හඳුන්වාදී ඇත. ප්‍රදේශ කිහිපයකට පමණක් යොමු වූ සංවර්ධන ක්‍රියාවලිය සහ පළාත් හා නාගරික මධ්‍යස්ථාන අතර ආර්ථික පරතරයක් ඇති කරන ආර්ථික ක්‍රමෝපායයන්ගෙන් බැහැර වී පළාත් නවයෙහිම ඇති එකිනෙකට වෙනස් ශක්තීන් උකහා ගනිමින් ආර්ථික වශයෙන් ඒවායේ විශේෂිත ක්ෂේත්‍රයන් තුළ එම පළාත් ශක්තිමත් කරලීම මෙම නව ක්‍රමෝපායේ මූලික අරමුණ වේ.

**විශේෂ ක්‍රියාකාරකම්**

- 2012 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා පත්‍රිකා සැකසීමේ දී අවශ්‍ය තාක්ෂණික සහාය හා තොරතුරු ලබා දීම.
- 2012 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකළපුව සහ අම්පාර යන දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් සැලසුම් සැකසීම සඳහා තාක්ෂණික සහාය හා තොරතුරු ලබාදීම.
- දිවිනැගුම වැඩසටහන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හඳුන්වාදීම සඳහා වැඩසටහනක් පැවැත්වීම.
- දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂවරුන් සමඟ දිස්ත්‍රික් සංවර්ධන ගැටළු හඳුනා ගැනීම සඳහා සහ දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා පළාත්පාලන හා පළාත් සභා අමාත්‍යාංශවලට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් සඳහා නිරීක්ෂණ ලබාදීම.
- පුර නැගුම වැඩසටහනේ මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගිවීම.

## 3.9 රාජ්‍ය කළමනාකරණය

රාජ්‍ය සේවයේ කාර්යක්ෂම හා සඵල ක්‍රියාකාරිත්වය සඳහා රටේ ආයතනික රාමුව හා කළමනාකරණය වැඩිදියුණු කිරීම අත්‍යවශය වේ. රාජ්‍ය සේවයේ කාර්යභාරය පෞද්ගලික අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම් වලට පහසුකම් සපයමින් සැලකිය යුතු කාර්යභාරයක් සිදුකිරීමේ වැදගත්කම හඳුනාගෙන තිබේ.

ප්‍රතිපත්ති සහාය සපයමින් සහ නවීන තාක්ෂණික පහසුකම් යටතේ ප්‍රධාන අංශ 05 ක් දියුණු කරමින් කළමනාකරණ අංශයේ අභිමතාර්ථයන් ජය ගැනීමට අපේක්ෂා කෙරේ. එනම්,

- අධිකරණ පද්ධතිය
- ආරක්ෂක සේවය
- සිවිල් සේවය
- ජාතික ඒකාබද්ධතා
- විදේශ කටයුතු

**විශේෂ ක්‍රියාකාරකම්**

2012 වසරේ දී අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා 62 ක් අනුමත කර ඇත. ඉන් වැදගත් ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ.

- ශ්‍රී ලංකා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ඈත මුහුදේ යාත්‍රා කළ හැකි ආරක්ෂක නෞකාවක් මිලදී ගැනීම.
- ශ්‍රී ලංකාවේ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා ජෛව මිති හඳුන්වාදීම.
- පුරවැසිභාවය සහ වීසා ලබාගැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍ර විද්‍යුත්ගත කිරීම.
- සමථ මණ්ඩල කටයුතු කිරිම.
- සැමට සාධාරණ යුක්තියක් උදෙසා නීති උදානය.
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නැවතීමේ පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- 2012 වසර තුළ මෙම අංශය විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 26 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. මීට අමතරව මෙම අංශය ප්‍රතිපත්ති සාකච්ඡා, වැඩමුළු හා රාජ්‍ය කළමනාකරණ අංශයට අදාළ රැස්වීම් සඳහා සහභාගි වන ලදී.

## 4. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය

**<u>පුස්තකාල සංවිධානය</u>**

- පිටතින් ලැබෙන සියළුම පොත්පත්, ලිපිලේඛන පුස්තකාලයට අත්කර ගැනීම සහ පරිශීලනයට පහසුවන ලෙස වර්ග කිරීම.
- සඟරා අංශය වැඩිදියුණු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා ලිපිලේඛන ක්‍රමවත්ව සැකසීම.
- පොත් එකතුව නැවත ක්‍රමානුකූලව සැකසීම.

**<u>බොදාහැරීම්, විමසීම් සහ විමර්ශන සේවා</u>**

- තොරතුරු අවශ්‍යතා විමසීම් ගැන කටයුතු කිරීම.
- පරිගණක දත්ත පදනම් උපයෝගී කරගෙන තොරතුරු ගවේශන සැකසීම.
- තොරතුරු ප්‍රවර්ධනය සඳහා පරිගණක භාවිතා කොට බෙදා හැරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ අවශ්‍යතා අනුව පුවත්පත් ලිපි සඟරා සුපරීක්ෂණය කිරීම.

**<u>අනෙකුත් පුස්තකාල සමඟ සම්බන්ධීකරණය</u>**

- වාර සඟරා ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- සම්මත ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් ජාතික පුස්තකාලය සහ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද පුස්තකාල ජාලයන්හි විවිධ කාර්යයන්ට දායකවීම.
- අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රමය පවත්වාගෙන යාම.

**<u>දේශීය තොරතුරු ජාලයන්ට සම්බන්ධවීම</u>**

- මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය (**www.intranet.mo.gor.lk.**) සඳහා නව තොරතුරු සැපයීම.
- **SLISTINET** තොරතුරු ජාලයට සහ මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද ආර්ථික සහ බැංකු පුස්තකාල ජාලයේ ( **E-BANK NET)** කාර්යයන්ට දායකවීම.
- ලංකා ජාතික පුස්තකාල ජාලය සමඟ දිගටම සම්බන්ධතා පවත්වාගෙන යාම.

## 5. මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය

### 2012.12.31 දිනට කාර්ය මණ්ඩලය

| | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | මාලනී ගමගේ මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | සී. විජේවර්ධන මිය | අධ්‍යක්ෂ |
| 03 | එස්.එස්. මුදලිගේ මහතා | අධ්‍යක්ෂ |
| 04 | කේ.ඩී.එස්.ආර්. පෙරේරා මහතා | අධ්‍යක්ෂ |
| 05 | ඩබ්.ඒ.ඩී.එස්. ගුණසිංහ මහතා | අධ්‍යක්ෂ |
| 06 | ජේ.ඒ.එස්. රූපසිංහ මිය | අධ්‍යක්ෂ |
| 07 | එම්.ගංගාදරන් මිය | අධ්‍යක්ෂ |
| 08 | කේ.ඩී.ඒ. මුණසිංහ මෙනවිය | අධ්‍යක්ෂ |
| 09 | ඊ.ඒ. රත්නසීල මහතා | අධ්‍යක්ෂ |
| 10 | එන්. විජේවීර මෙනවිය | අධ්‍යක්ෂ (මුදල්) |
| 11 | සී.සේනානායක මිය | අධ්‍යක්ෂ |
| 12 | ටී.ඒ.ඩී.ඩී. ප්‍රේමරත්න මහතා | අධ්‍යක්ෂ |
| 13 | ටී.එම්.ජේ. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ |
| 14 | එම්.එෆ්. මුබාරක් මහතා | අධ්‍යක්ෂ |
| 15 | පී.එච්. චන්දිමා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 16 | එච්.ආර්.වී.පී. විජේවර්ධන මහතා | සහකාර අධ්‍යක්ෂ |
| 17 | ඩී.පී. නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 18 | ආර්.කේ.එම්.එන්.එන්. පලිපාන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 19 | ඒ. කවිතා මෙනවිය | සහකාර අධ්‍යක්ෂ |
| 20 | පී.එම්.එස්. ජයතිලක මහතා | සහකාර අධ්‍යක්ෂ |
| 21 | එන්.එම්.ඒ.ඩී.කේ. නවරත්න මෙනවිය | සහකාර අධ්‍යක්ෂ |
| 22 | කේ.එන්.පී. ජයරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ |
| 23 | ටී.එම්.ඩී.පී. තෙන්නකෝන් මහතා | සහකාර අධ්‍යක්ෂ |
| 24 | ඩබ්.එල්.පී.ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ |
| 25 | ආර්.කේ.එල්. ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 26 | ටී.වයි.එල්. මුණසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 27 | ආර්.ඩී.ඒ. මෛත්‍රීරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ |
| 28 | ජී.ආර්.සී. හේවාවසම් මිය | සහකාර අධ්‍යක්ෂ |

| | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 29 | එම්.ඒ.ජී. තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 30 | ඊ.ඒ.සී.ඩී. පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 31 | අයි. ලංකාතිලක මිය | සහකාර අධ්‍යක්ෂ |
| 32 | ඩබ්.ඒ.ජේ.සී. වික්‍රමආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 33 | ඩී.ඒ. මනෝරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 34 | ඩබ්.ඒ. වල්පිට මිය | සහකාර අධ්‍යක්ෂ |
| 35 | ඩී.එච්.ආර්.ඩී. විජේවර්ධන මෙනවිය | සහකාර අධ්‍යක්ෂ |
| 36 | කේ.ජී.ආර්.ජී.ආර්. වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 37 | එන්.ටී. අමරතුංග මිය | සහකාර අධ්‍යක්ෂ |
| 38 | ඩී.පී.එස්.එම්. දයාසේකර මහතා | සහකාර අධ්‍යක්ෂ |
| 39 | ආර්.ඒ.ඩී. ලක්ෂ්මි මිය | පරිපාලන නිලධාරි |
| 40 | එච්.එම්.ආර්.ඒ. බණ්ඩාර මහතා | සැලසුම් සහකාර |
| 41 | එස්.ඩී. ඉලේපෙරුමආරච්චිගේ මෙය | සැලසුම් සහකාර |
| 42 | කේ.ඒ.එච්.කේ. පෙරේරා මිය | සැලසුම් සහකාර |
| 43 | ඊ.එන්.කේ.ජී.කේ.එම්. ඒකනායක මය | සැලසුම් සහකාර |
| 44 | කේ.ඒ.ජී. දිල්රුක්ෂි මිය | සැලසුම් සහකාර |
| 45 | එස්.එම්.ඩී.ඩී. සමරකෝන් මිය | සැලසුම් සහකාර |
| 46 | එස්.ඩී.සී. ප්‍රියංකා මිය | ව්‍යාපෘති නිලධාරි |
| 47 | එච්.එම්. සුධර්මා හේරත් මිය | ව්‍යාපෘති නිලධාරි |
| 48 | එස්.ඒ.ජී.සී. ජයසේකර මිය | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරි |
| 49 | ඒ.ආර්. චන්ද්‍රා පද්මිණි මෙය. | රා.ක.ස.සේ. I |
| 50 | ඒ. රාමනායක මිය | රා.ක.ස.සේ. I |
| 51 | ජේ.කේ. රෝහිණි මිය | රා.ක.ස.සේ. II |
| 52 | ආර්.ඒ.ඩී.කේ. රාජපක්ෂ මිය | රා.ක.ස.සේ. II |
| 53 | ආර්.එම්. පද්මසීලි මෙය. | රා.ක.ස.සේ. II |
| 54 | පී.කේ.කේ.ආර්. රාජකරුණා මිය | රා.ක.ස.සේ. II |
| 55 | ඩබ්.ඩී.පී. ප්‍රනාන්දු මිය | රා.ක.ස.සේ. II |
| 56 | එච්.ඩී.ජී.නිමල් මයා | රා.ක.ස.සේ. II |
| 57 | ඒ.එස්.එම්.වී.ඒ. චන්ද්‍රාණි මිය | රා.ක.ස.සේ. II |
| 58 | ඩබ්.එන්.පී.ජයසිංහ මිය | රා.ක.ස.සේ. II |
| 59 | පී.යු. මැදවත්තගේ මිය | රා.ක.ස.සේ. II |
| 60 | එම්.එස්.රණසිංහ මයා | රා.ක.ස.සේ. III |

| | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 61 | පී.එස්.ආර්.පීරිස් මයා | රා.ක.ස.සේ. III |
| 62 | කේ.එල්.ඩබ්.සී.එල්. ද සිල්වා මෙනවිය | රා.ක.ස.සේ. II |
| 63 | ඩී .රසාංජන ප්‍රනාන්දු මහතා | කා.කා.ස .I |
| 64 | එම්.එල්.ඒ. නලීන් මහතා | කා.කා.ස .I |
| 65 | ඒ.එම්.ආර්.එස්.ඩී. කුමාර මහතා | කා.කා.ස.II |
| 66 | බී .ප්‍රියන්ත මහතා | කා.කා.ස.II |
| 67 | ආර්.ඒ.පී .පුෂ්ප කුමාර මහතා | කා.කා.ස.II |
| 68 | ඩබ්ලිව්.එම් .ජිනදාස මහතා | කා.කා.ස.II |
| 69 | එන්.එස්.යූ.කේ .සිල්වා මහතා | කා.කා.ස.II |
| 70 | ඩී.ඒ.එන් .චන්ද්‍රතිලක මහතා | කා.කා.ස.II |
| 71 | ජී.එස් .රෝහණ මහතා | කා.කා.ස.II |
| 72 | එම්.පී.ආර් .රත්නායක මහතා | කා.කා.ස.II |
| 73 | ආර්.ඒ.කේ.අනුර කිත්සිරි මයා | කා.කා.ස.II |
| 74 | කේ.කේ.සී. කරස්නාගල මයා | කා.කා.ස.III |
| 75 | පී.එස්.කේ. පෙරේරා මයා | කා.කා.ස.III |
| 76 | එම්.ඒ.එස්.කේ.ජයවර්ධන මහතා | රියදුරු .II "අ" |
| 77 | එස් .ගුණදාස මහතා | රියදුරු II "අ" |
| 78 | ටී .රත්නසිරි මහතා | රියදුරු II "ආ" |
| 79 | කේ.ජේ .කුමාරසිංහ මහතා | රියදුරු II "අ" |
| 80 | ඩබ්ලිව්.එම්.එන් .කරුණාතිලක මහතා | රියදුරු II |
| 81 | ආර්.ඒ .තිලක් මහතා | රියදුරු II "අ" |
| 82 | කේ.වී.ඩී.ඒ.පී .කරවිට මහතා | රියදුරු I |
| 83 | එම්.කේ.යූ .නිශාන්ත මහතා | රියදුරු II "ආ" |
| 84 | ඒ .විජේතුංග මහතා | රියදුරු I |
| 85 | ඩී.බී.දිසානායක මහතා | රියදුරු II "අ" |
| 86 | එල්.කේ. ධර්මදාස මහතා | රියදුරු II "අ" |
| 87 | එම්.කේ.ඩී.එන්.සේනාරත්න මයා | රියදුරු I |
| 88 | කේ.එම්.කරුණාසේන මයා | රියදුරු II "ආ" |
| 89 | කේ.ඒ.ඩී.සෝමරත්න මයා | රියදුරු I |

**2012 වර්ෂයේ නව පත්වීම්**

| | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | ඩී.පී.එස්.එම්.දයාසේකර මහතා | සහකාර අධ්‍යක්ෂ |
| 02 | ආර්.ඒ.ඩී.ලක්ෂ්මි මිය | පරිපාලන නිලධාරි |

**2012 වර්ෂයේ උසස්වීම්**

| | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | එන්.විජේවීර මෙනවිය | අධ්‍යක්ෂ |
| 02 | සී.සේනානායක මිය | අධ්‍යක්ෂ |
| 03 | ටී.ඒ.ඩී.ඩී.ප්‍රේමරත්න මහතා | අධ්‍යක්ෂ |
| 04 | ටී.එම්.ජේ.බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ |
| 05 | එම්.එෆ්.මුබාරක් මහතා | අධ්‍යක්ෂ |

**2012 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරින්**

| | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | බී.අයි.හෙන්දවිතාරණ මෙනවිය | පුස්තකාලාධිපති |
| 02 | අයි.පතිරණ මෙනවිය | කළමනාකරණ සහකාර |

**2012 වර්ෂයේ ස්ථාන මාරුවී පැමිණි නිලධාරින්**

| | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | මාලනි ගමගේ මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | ඩී.පී.නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 03 | ඩබ්.එල්.පී.ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ |
| 04 | කේ.එල්.ඩබ්.සී.ලාලනී ද සිල්වා මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර II |
| 05 | පී.සංජීව රෝහන පීරිස් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර.III |
| 06 | ඩබ්.එන්. ප්‍රිය ජයසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර II |
| 07 | එම්.කේ.යූ.නිශාන්ත මයා | රියදුරු II ආ |
| 08 | එල්.ඒ.කේ.ධර්මදාස මයා | රියදුරු I |
| 09 | ටී.ජී.වසන්ත කුමාර මයා | රියදුරු II ආ |
| 10 | එම්.ජී.සුගතදාස මයා | රියදුරු I |
| 11 | ඩී.විජේබණ්ඩාර මයා | රියදුරු II |
| 12 | එන්.කේ.ඩී.එන්.සේනාරත්න මයා | රියදුරු I |

| | | |
|---|---|---|
| 13 | ඩබ්.එන්.එන්.කරුණාතිලක මයා | රියදුරු II |
| 14 | ඩී.ජ්.විජේතුංග මයා | රියදුරු I |
| 15 | බී.සුසන්ත මයා | රියදුරු II |
| 16 | ඩී.බී.දිසානායක මයා | රියදුරු II |
| 17 | කේ.වී.ජ්.ඩී.පී.කරවිට මයා | රියදුරු I |
| 18 | කේ.ජේ.කුමාරසිංහ මයා | රියදුරු II අ |
| 19 | කේ.එම්.කරුණාසේන මයා | රියදුරු II ආ |
| 20 | දමිත රසාංජ මයා | කා.කා.ස I |
| 21 | එච්.එම්.ජිනදාස මයා | කා.කා.ස II |
| 22 | සරත් රෝහණ මයා | කා.කා.ස II |
| 23 | ජ්.එම්.ආර්.එස්.ධම්මික කුමාර මයා | කා.කා.ස II |
| 24 | උදය කුමාර සිල්වා මයා | කා.කා.ස II |
| 25 | කේ.පී.ජානකී තුෂාරි කරුණානායක මිය | කා.කා.ස II |
| 26 | ජේ.ජ්.එස්.ශ්‍රී ජයසිංහ මයා | කා.කා.ස I |
| 27 | එච්.එම්.ප්‍රේමරත්න මයා | කා.කා.ස I |
| 28 | එච්.යූ.අයි.ප්‍රේමරත්න මයා | කා.කා.ස I |
| 29 | ආර්.ජ්.කිත්සිරි මයා | කා.කා.ස II |
| 30 | එම්.පී.ආර්.රත්නායක මයා | කා.කා.ස II |

**2012 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරින්**

| | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | බී.එම්.එස්.බටගොඩ මයා | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | එම්.රාමමූර්ති මයා | අධ්‍යක්ෂ |
| 03 | ඩබ්.එම්.එස්.වික්‍රමසිංහ මයා | සහකාර අධ්‍යක්ෂ |
| 04 | පී.එස්.පී.පෙරේරා මයා | සහකාර අධ්‍යක්ෂ |
| 05 | එන්.පී.කොළඹආරච්චි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I |
| 06 | ජී.ජ්.එන්.පෙරේරා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I |
| 07 | ජ්.එම්.පී.ද සිල්වා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I |
| 08 | එච්.ජ්.ආර්.එස්.කේ.ජයසේකර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර I |
| 09 | එස්.එන්.සමරසිංහ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර II |
| 10 | එච්.ඩී.ශිරන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර II |
| 11 | එම්.ජී.සුගතදාස මයා | රියදුරු |
| 12 | ඊ.එම්.රාජරත්න මයා | රියදුරු I |

| | | |
|---|---|---|
| 13 | සී.එදිරිසිංහ මයා | රියදුරු I |
| 14 | ටී.ජී.වසන්ත කුමාර මයා | රියදුරු II ආ |
| 15 | එස්.ඒ.ආර්.දිසානායක මයා | රියදුරු II |
| 16 | එස්.වෙත්තසිංහ මයා | රියදුරු I |
| 17 | කේ.ටී.සනත් සුමනසිරි මයා | රියදුරු |
| 18 | ඩබ්.ඩබ්.සී.ඒ.බණ්ඩාර මයා | රියදුරු |
| 19 | කේ.ඒ.එස්.ආර්.ලක්සිරි මයා | රියදුරු |
| 20 | ජේ.ඒ.ඒ.පීරිස් මයා | කා.කා.ස |
| 21 | එම්.සෙල්වරාජ් මයා | කා.කා.ස |
| 22 | අයි.ඩී.ඩී.කුමාරසිරි මයා | කා.කා.ස |
| 23 | එම්.පී.එස්.රත්නකුමාර මයා | කා.කා.ස |
| 24 | එම්.තලගල මයා | කා.කා.ස |
| 25 | කේ.එම්.ප්‍රේමරත්න මයා | කා.කා.ස |
| 26 | ටී.ආර්.සුභාශිණී මිය | කා.කා.ස |
| 27 | ජේ.ඒ.ඩී.එස්.ජයසිංහ මයා | කා.කා.ස |
| 28 | එච්.ඒ.පී.පෙරේරා මයා | කා.කා.ස |
| 29 | ඩබ්.එම්.දසනායක මයා | කා.කා.ස |
| 30 | කේ.පී.ටී.ටී.කරුණානායක මයා | කා.කා.ස |
| 31 | එච්.යූ.අයි.ප්‍රේමරත්න මයා | කා.කා.ස |

**විදේශ පුහුණු - 2012**

| අනු අංකය | නම | තනතුර | පාඨමාලාව සහ රට | කාලය |
|---|---|---|---|---|
| 01 | ඩබ්.ඒ.ඩී.එස්. ගුණසිංහ මහතා | අධ්‍යක්ෂ | **තායිලන්තයේ පැවති** Sixty –Eight Session of the United National Economic and Social Commission for Asia and the Pacific (UNESCAP) වැඩමුළුව<br><br>**තායිලන්තයේ පැවති** Impact Evaluation and Policy Reform for Poverty Reduction වැඩමුළුව<br><br>**කොරියාවේ පැවති** International Workshop on Strengthening Planning & Implementation Capacities for Sustainable Development in Post Rio+20 Context වැඩසටහන | සති 1<br><br>දින 3<br><br>දින 3 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | ඊ.ඒ.රත්නසීල මහතා | අධ්‍යක්ෂ | මැලේසියාවේ පැවති Sri Lanka – Malaysia Knowledge Exchange on Skills Development Strategies වැඩ සටහන<br><br>ජපානයේ පැවති IDEAS Follow up Programme වැඩසටහන<br><br>කොරියාවේ පැවති ADB Research & Dev. Technical Assistance Project on Education and Skills for Inclusive Growth and Green Jobs Knowledge Sharing වැඩසටහන | දින 8<br><br>දින 6<br><br>දින 5 |
| 03 | එස්.එස්.මුදලිගේ මහතා | අධ්‍යක්ෂ | භූතානයේ පැවති SASEC (South Asia Subregional Cooperation) Energy Working Group (ENWG Meeting) වැඩමුළුව<br><br>ජපානයේ පැවති Expert Group Meeting of UN – Habitat for Asia & the Pacific වැඩසටහන | දින 3<br><br>දින 2 |
| 04 | ටී.එම්.ජේ.බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ | චීනයේ බීජිං නුවර පැවති Meeting on Asian Approaches to pro poor Growth<br><br>ඉන්දියාවේ පැවති International Conference on Implementing Social Programme වැඩ සටහන<br><br>චීනයේ පැවති Study Tour on Development Planning වැඩමුළුව | දින 3<br><br>දින 3<br><br>දින 5 |
| 05 | ආර්.කේ.එම්.එන්.එන් . පලිපාන | සහකාර අධ්‍යක්ෂ | කොරියාවේ පැවති SAARC Special Training Program Economic Development Strategy වැඩ සටහන<br><br>ජපානයේ පැවති Regional Training Workshop on Use of Population & Housing Census Data for Local Development Planning වැඩමුළුව | සති 2<br><br>දින 5 |
| 06 | කේ.එන්.පී.ජයරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Training Course on Regional Economic and Financial Monitoring වැඩ සටහන | සති 3 |
| 07 | ආර්. ඩී.ඒ. මෛත්‍රීරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ | ජිනීවාහි පැවති Public – Private Partnership (PPP) Days 2012 Developing Instruction for Efficient PPP Programs වැඩ සටහන<br><br>එක්සත් ජනපදයේ පැවති Public – Private Partnerships Course වැඩ සටහන | දින 4<br><br>දින 5 |

| | | | | |
|---|---|---|---|---|
| 08 | පී.එම්.එස්.ජයතිලක මහතා | සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Seminar on Coastal Region Economic Development for Developing Course Countries වැඩමුළුව | සති 3 |
| 09 | කේ.ජී.ආර්.ජී.ආර්. වික්‍රමවර්ධන | සහකාර අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවති Regional Workshop on Mainstreaming Ecosystem Services Approaches in to Development Application of Economic Valuation for designing Innovation response Policies වැඩ සටහන | දින 5 |
| 10 | ඉනෝකා ලංකාතිලක මිය | සහකාර අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවති Regional Training Course on Pre Disaster Natural Hazard Loss Estimation වැඩ සටහන | දින 5 |
| 11 | ඩී.ඒ.සී.ඩී.පීරිස් | සහකාර අධ්‍යක්ෂ | තායිලන්තයේ පැවති Regional Training Course on Pre Disaster Natural Hazard Loss Estimation වැඩ සටහන | දින 5 |
| 12 | ආර්.කේ.එල්. ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවති Final Regional Workshop on Social Protection Index වැඩසටහන<br><br>ඉන්දියාවේ පැවති South–South Learning Forum 2012 on Building Resilience and Opportunity: The Role of Labor & Social Assistance Policies වැඩ සටහන | දින 3<br><br>දින 5 |
| 13 | එන්.එම්.ඒ.ඩී.කේ. නවරත්න | සහකාර අධ්‍යක්ෂ | කොරියාවේ පැවති 2012 KOIKA Training Programs to Sri Lanka Technology and Policy (For Asian Countries) වැඩ සටහන | සති 3 |
| 14 | ඒ.කවිතා මිය | සහකාර අධ්‍යක්ෂ | මියන්මාරයේ පැවති Regional Meeting on Non-Communicable Diseases, including Mental Health and Metrological disorders – වැඩසටහන<br><br>එක්සත් රාජධානියේ පැවති Master in Policy Economics for 2012 – 2013 උපාධි පාඨමාලාව | දින 3<br><br>අවුරුදු 01 |
| 15 | ජී.ආර්.සී.හේවාවසම් මිය | සහකාර අධ්‍යක්ෂ | චීනයේ පැවති Request for visa to attend the workshop no ‘Evaluation & Results Based Planning & Budgeting at SHIPDET People’s වැඩසටහන | දින 5 |
| 16 | ටී.වයි.එල්.මුණසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ | සිංගප්පූරුවේ පැවති Training Course on Enabling Private Sector Growth and Attracting FDIs වැඩසටහන | සති 2 |

| | | | | |
|---|---|---|---|---|
| 17 | එස්. ඒ. ජී. සී. ජයසේකර මිය | සංවර්ධන නිලධාරි | පිලිපීනයේ පැවති Workshop on Familiarize Parties with the Process and the Requirements for the Accreditation of Motional Implementation entities for Direct Access under the Adaptation funds for Asia and Eastern Euope වැඩ සටහන | දින 2 |
| 18 | එම්.ගංගාධරන් මිය | අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවති 2012 Transport Forum: Inclusive & Sustainable Transport වැඩසටහන | දින 5 |
| 19 | එස්.ඩී.අයි.ආරච්චිගේ මිය | සංවර්ධන නිලධාරි | ඉන්දියාවේ පැවති Workshop on Library "KOHA" Gujarat වැඩ සටහන | දින 5 |
| 20 | කේ.ඩී.ඒ.මුණසිංහ මිය | අධ්‍යක්ෂ | පිලිපීනයේ පැවති DMS Project Processing Practices Forum වැඩ සටහන . | දින 3 |
| 21 | ටී.එම්.ඩී.පී. තෙන්නකෝන් මහතා | සහකාර අධ්‍යක්ෂ | නේපාලයේ පැවති South Asia Regional Conference on Rural Water Supply and Sanitation වැඩ සටහන | දින 3 |
| 22 | එන්.ටී.අමරතුංග මිය | සහකාර අධ්‍යක්ෂ | කොරියාවේ පැවති Training Programme on UNDP Gender-Responsive Economic Policy Management වැඩ සටහන | සති 3 |
| 23 | මාලනී ගමගේ මිය | අධ්‍යක්ෂ ජනරාල් | චීනයේ පැවති Study Tour on Development Planning වැඩ සටහන | දින 9 |
| 24 | ටී.ඒ.ඩී.ඩී.ප්‍රේමරත්න මහතා | අධ්‍යක්ෂ | චීනයේ පැවති Study Tour on Development වැඩ සටහන | සති 1 |
| 25 | ජේ.එස්.එස්.රූපසිංහ මිය | අධ්‍යක්ෂ | කොරියාවේ පැවති 2012 Knowledge Sharing Programme (KSP) Sri Lanka High-Level Policy Seminar වැඩසටහන . | සති 1 |

## 6. මූල්‍ය කාර්ය සාධනය

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල සඳහන් පරිදි වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන සහ මුළු වියදම, පුනරාවර්තන සහ මූලධන වශයෙන් පහත පරිදි සාරාංශ කළ හැක.

| වැඩසටහනෙහි නම | 2011 | | 2012 | | වෙනස් වීමේ ප්‍රතිශතය ( %) (2011 වර්ෂයේ සත්‍ය වියදම් මත) |
|---|---|---|---|---|---|
| | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | |
| පුනරාවර්තන | 52,125,000.00 | 50,936,303.00 | 55,920,500.00 | 54,717,891.00 | 7.42 |
| මූලධන | 151,900,000.00 | 117,038,655.00 | 123,023,500.00 | 122,084,857.00 | 4.31 |
| **එකතුව** | **204,025,000.00** | **167,974,958.00** | **178,944,000.00** | **176,802,748.00** | **5.25** |

ඉහත සඳහන් තොරතුරු අයවැය ඇස්තමේන්තු වල සඳහන් පරිදි උප ව්‍යාපෘති අනුව වර්ග කර පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ හැක.

| උප ව්‍යාපෘතිය | වැඩසටහනෙහි නම (රුපියල්) | 2011 | | 2012 | | වෙනස් වීමේ ප්‍රතිශතය (%) (2011වර්ෂ යේ සත්‍ය වියදම් මත) |
|---|---|---|---|---|---|---|
| | | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | |
| | **පුනරාවර්තන** | **52,125,000.00** | **50,936,303.00** | **55,920,500.00** | **54,717,891.00** | **7.42** |
| 0 | සාමාන්‍ය පරිපාලනය | 48,713,500.00 | 48,192,410.00 | 52,586,500.00 | 52,343,576.00 | 8.61 |
| 2 | ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික කවුන්සිලය | 3,411,500.00 | 2,743,893.00 | 3,334,000.00 | 2,374,315.00 | -13.46 |
| | **මූලධන** | **151,900,000.00** | **117,038,655.00** | **123,023,500.00** | **122,084,857.00** | **4.31** |
| 0 | සාමාන්‍ය පරිපාලනය | 1,900,000.00 | 1,681,810.00 | 2,120,000.00 | 1,886,554.00 | 12.17 |
| 1 | අධ්‍යාපන අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය | 1,000,000.00 | - | - | - | - |
| 2 | ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික කවුන්සිලය | - | - | 229,500.00 | 229,500.00 | - |
| 7 | නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති කළමනාකරණය | 78,000,000.00 | 66,043,783.00 | 63,645,000.00 | 63,521,959.00 | -3.81 |
| 8 | නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති කළමනාකරණය | 40,600,000.00 | 37,285,496.00 | 53,779,000.00 | 53,761,809.00 | 44.18 |
| 9 | සහශ්‍ර සංවර්ධන අරමුණුවල ජාතික ශක්‍යතාවය ශක්තිමත් කිරීම (එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන) | 20,000,000.00 | 10,714,157.00 | - | - | - |
| 10 | ජනගහනය හා සංවර්ධන(එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල) | 9,000,000.00 | - | - | - | - |
| 11 | සැලසුම් කිරීම , සුපරීක්ෂණය කිරීම සහ ඇගයීමේ වැඩසටහන (යුනිසෙෆ් අරමුදල) | 1,000,000.00 | 1,000,000.00 | - | - | - |
| 12 | හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 400,000.00 | 313,409.00 | 3,250,000.00 | 2,685,035.00 | 756.71 |
| **එකතුව** | | **204,025,000.00** | **167,974,958.00** | **178,944,000.00** | **176,802,748.00** | **5.25** |